


# ගුණපාල පතිරාජ

**ගුණපාල පතිරාජ මහතා ප්‍රකට සමාජ හා දේශපාලන ක්‍රියාධරයෙකි. දශක ගණනාවක් පුරා පරම්පරා ගණනාවක් සමඟ සිය මෙහෙවරෙහි යෙදුණු පතිරාජයෝ දෘෂ්ටියෙන් වාමාංශිකය. ප්‍රගතිශීලීය. සමාජ සේවාවෙහි මහ බරක් ඉසිලූ ක්‍රියාධරයෙකි. ඔහු ලංකාවේ මිත්‍යාවන් හා වැඩවසම් ආකල්ප සමාජ සංවර්ධනයට හරහට සිටින බව විශ්වාස කරන්නෙකි. ඒවාට එරෙහි සමාජ දැනුම සම්පාදනය සඳහා ලංකාවේ, විශේෂයෙන් කුරුණෑගල ආශ්‍රිතව සිය බිරිඳ හා සගයන් සමඟ පොරබැදූ අයෙකු ලෙස ඉතිහාසගත වනු ඇත. ඔහු ප්‍රකට කවියෙක් හා සාහිත්‍යකරුවෙකුද වෙයි. පහත ඇත්තේ ඔහු විසින් රචිත කෘති ද්විත්වයකි.**






## සම්මා දිට්ඨි

### ගුණපාල පතිරාජ

### කුරුණෑගල නිවහල් සිතුවිලි සංසදය

*එහි එන එක් කවියක් මෙසේය.*

### සයිටම් දෙවිවරු

මිහිපිට දෙවිවරු පාරට බැහැලා
සයිටම් එරෙහිව එන්නලු සැමවිට
ගිලනුන් මිය යන අපේ රටේ
සයිටම් දෙවිවරු ප්‍රමිතිය නැහැල්ලු

කට්ටඩියන් සහ පූජක සමහරු
ගෙන්ෂුයි ජොහොරේ තවත් ඒව ඇත.
බෙහෙත් නොදී ලෙඩ සුවපත් කෙරුමට
යාඥාව හා යාග හෝම ඇත.

හොර වෙදවරු දෙති බේත් නියම කර
අරිෂ්ට කසාය කල්ක ආදි දේ
ලෙඩ ගැන නොදන්න මේ අය කරනා
විනාසෙ ගැන හිතුවද ඔය දෙවිවරු

එකෙකුන් හෝ ලෙඩවූ අප රට තුළ
දිනකට මිය යනු නියතයි මෙතුළින්
සයිටම් සද්දෙන් මේ දේවලටත්
විරුද්ධ විය යුතු නොවේ ද දෙවිවරු

*(පිටුව 48)*

සම්මා දිට්ටි කාව්‍ය සංග්‍රහයේ පසුවදනේ මෙලෙස සඳහන් වේ.

*'සමස්තයක් ලෙස ගත්කල සත්‍යය හෙළිදරව් කිරීම පිණිස කවිය වැනි සාහිත්‍ය මාධ්‍යයක් මෙතෙක් නිවැරදිව යොදාගෙන නැති තත්ත්වයක් යටතේ 'සම්මා දිට්ඨී' සාකච්ඡාවට බඳුන් විය යුතුය. 'සම්මා දිට්ඨී' කියවීමේදී, අපූර්වත්වයෙන් හෙබි කවි ගොන්නක් මතුවටත් අප වෙත තිළිණ කිරීමේ ප්‍රතිභාවක් ගුණපාල පතිරාජ කවියා වෙතින් පිළිබිඹු වන බව සටහන් කිරීම නිවැරදි යැයි හඟිමි.'*

**- එඩ්වඩ් කාලිංග -**

## අඳුරට පහනක්

මිත්‍යා විශ්වාෂයන්ට එරෙහි පතිරාජ මෙහෙවරෙහි තවත් පියවරකි. කාව්‍ය හා ගද්‍ය නිර්මාණ ද්විත්වයම ඇතුළත් මෙම කුඩා ග්‍රන්ථයෙහි සිය අරමුණ පතිරාජයන් මෙසේ සඳහන් කරයි.

''මෙම පුංචි පොත සරල ගැමි බසින් ලියවුණු ගද්‍ය පද්‍ය නිර්මාණයකි. අප සමාජයේ ආගමික, දේශපාලනික සහ සංස්කෘතික දේහයන් වෙලාගෙන සිටින මිත්‍යා අන්ධකාරය දුරු කිරීම උදෙසා එය පුංචි පහනක් සේ ක්‍රියාකරනු ඇත. එසේම, නිවහල් දර්ශනයක් වූ ආරම්භක බුදුදහම කුමක්ද යන්න සොයා බැලීම සඳහා සියුම් ඉඟියක්ද නිදහස් මනසකින් යුතු කෙනෙකුට මෙහි අන්තර්ගතය තුළින් සොයා ගත හැකිවනු ඇත.

**මෙම කෘතියද කුරුණෑගල නිවහල් සිතුවිලි සංසදයේ ප්‍රකාශනයකි.**

**- චබීරා -**

---

හරියට අපහාස කළා. රුහුණ අල්ලා ගත්තා. දෙවැනි පරාක්‍රමබාහු රජුගේ කාලේ බොහොම ප්‍රබල බෞද්ධ සංස්කෘතියක් බිහි වුණා. දරුණු දේවල් වුණේ නෑ. හතරවැනි පරාක්‍රමබාහු රජුගෙ කාලෙත් ඒ වගෙ වෙනස් බෞද්ධ සංස්කෘතියක් බිහි වුණා. ඒ කියන්නේ බෞද්ධ සංස්කෘතිය කියන දේ නිම කරන්න බෑ. එක එක කාල සීමාවෙදි එක එක දේවල් වෙනවා. මම හුඟක් ගෞරවයෙන් සලකන්නේ දෙවැනි පරාක්‍රමබාහු රජ්ජුරුවෝ.

**'දඹදෙණි කතිකාවත' ඇති කරන්න දෙවැනි පරාක්‍රමබාහු රජු මුල් වුණා නේද?**

ඒ සම්ප්‍රදාය දිගට ම ආවා. දෙවැනි පරාක්‍රමබාහු රජ්ජුරුවන්ට පෙරත් කතිකා තිබුණා. පළවෙනි පරාක්‍රමබාහු රජුගේ කාලෙත් තිබුණා. ඒකෙන් අදහස් කරන්නේ සමහරක් කාලවල බෞද්ධ සම්ප්‍රදාය ඉතාම දරුණු විදිහට පිරිහුණු බවයි.

**නූතන යුගයට අපිට කතිකාවත් ගේන්න බැරිද?**

ගෙන්න පුළුවන්. නමුත් කවුද පිළිගන්නේ? දැන් ඉන්න දේශපාලනඥයෝ ඕවා ගණන් ගන්නේ නැහැ. නමුත් සමාජයක් හැටියට 'අපිට මොකද වුණේ' කියන ගැටලුව සාකච්ඡාවට ගත යුතුයි.

**ශාසනය තුළ කුල භේදය ඇතිවුණේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ බවට පොදු විශ්වාසයක් තිබෙනවා. මේ සඳහා පාදක කර ගන්නෙ 'මන්දාරම්පුර පුවත' කෘතියේ සඳහන් සිද්ධියක්?**

ඒක පිළිගන්න බෑ. 'මන්දාරම්පුර පුවත' ලියැවුණේ පහු කාලෙ. ඒක ශාස්ත්‍රීය කෘතියක් විදිහට සලකන්න බැහැ. මම සලකන්නෙත් නැහැ. මේ පොතේ එක එක කාලේ ලියැවුණු කොටස් තියෙනවා. සමහරක් ඒවා ලියුවේ හුඟක් පහුවෙලා. සංඝයා වහන්සේ හොඳ කුලයකින් එන්න ඕනෑ කියන අදහස පළවෙනි විමලධර්මසූරිය රජ්ජුරුවන්ගේ කාලෙත් තිබුණා. ඒ ගැන වැඩි විස්තරයක් නැහැ. නමුත් හැම දෙනාම සංඝ ශාසනේට බාර ගත්තෙ නැහැ. ඒකත් ප්‍රශ්නයක්. මගේ හිතේ, පහතරට නිකාය කිහිපයක් ඇති වුණේ ඒ නිසයි. සමහර නිකායන් මිනිස්සු පිළිගත්තේ නැහැ. අනික පහතරට මිනිස්සු හුඟක් දෙනෙක් මෑත කාලේ ඉන්දියාවෙන් ලංකාවට ආව අයනෙ. මේ අදහස් දිගටම තිබුණා. එක අතකින් අපි සේරම බෞද්ධයෝ කියලා කියත හැකි. අනික් අතින් බලනකොට මුල් කාලෙ ඉඳලම හුඟක් වෙනස්කම් තිබුණා. බටහිර සමාජ පවා පුරාවෘත්තකරණයේ අනතුරෙන් නිදහස් නැති බව සාහ්ලින්ස් පිළිබඳ විවාදයේදි අපි දුටුවා.

**ඔබගේ නවතම කෘතියට අනුව "දුෂ්ට දෙමළ රජෙක්" ගැන කතන්දරය තවත් යටත්විජිත පුරාවෘත්තයක් ද?**

ඔවුන් මේක පෙන්වා දෙන්න හදන්නේ විද්‍යාත්මක දෙයක් හැටියට. මේක මවාගත්ත පුරාවෘත්තයක් බව මම පෙන්වා දුන්නා. මේ ගැන මගේ විවේචනය දැන් කවුරුත් පිළිගන්නවා. නමුත් ඒ වෙලාවේ හුඟක් මිනිස්සු එරෙහි වුණා. යුරෝපයේ පමණක් නොවෙයි, ඕස්ට්‍රේලියාව වගේ හැම තැනම මට බැණුම් අහන්න සිද්ද වුණා. ශ්‍රී වික්‍රම රාජසිංහ ගැනත් මම ලිව්වෙ ඒ නිසයි. ලංකා රාජ්‍ය අල්ලා ගන්න, බ්‍රිතාන්‍ය මිනිස්සුන්ට රාජසිංහ 'නරක රජ කෙනෙක්' හැටියට පෙන්වන්න ඕනෑ වුණා. විශේෂයෙන් වෙලෙස්ලි වගේ ඇයෝ ඉන්දියාවේ හිටිය රජවරුන්ට මේ වගේම නින්දා කෙරුවා. එක රජ කෙනෙක් බුරුමෙට කරත්තෙන් දක්කාගෙන ගියා. මගේ හිතේ, ඒ අතින් බලනකොට රාජසිංහ රජ්ජුරුවන්ට එච්චර දරුණු විදිහට අපහාස කළේ නැහැ. කොහොමහරි රාජසිංහ රජ්ජුරුවෝ නෙරපලා දොට්ට දාන්න වුවමනා වුණා. නැතිව බ්‍රිතාන්‍ය ආණ්ඩුවට රජ කරන්න වෙන විදියක් තිබුණේ නෑ. ඒකනේ මගේ පොතට "ඩූම්ඩ් කිංග්" (වැනසීමට නියම වූ රජු) කියන නම දුන්නේ.

**එතකොට ඇහැලේපොළගේ භූමිකාව කුමක්ද ?**

මගෙ හිතේ කවුරුත් දන්නවා ඇහැලේපොළ වර්ණනාව, වඩිග හටන, කිරල සන්දේශය වගේ පොත්වලින් ඇහැලේපොළ රජ වෙන්න බලාපොරොත්තු වුණ බව පෙන්වලා දෙනවා. මේ මිනිහා මෝඩ මනුෂ්‍යයෙක්. නැත්නම් බ්‍රිතාන්‍ය රාජ්‍යයක් යටතේ එයාට රජවෙන්න දෙයි කියලා කවදාවත් හිතන්න පුළුවන්ද. රජ්ජුරුවන්ගේ ඔටුන්න ඇහැලේපොළ පැළඳගෙන හිටියා කියලා මම එක තැනක පෙන්වා දුන්නා. කොයිතරම් මෝඩකමක් ද? බ්‍රිතාන්‍ය මිනිස්සු ඉන්න තෙක් තමාට කවදාවත් රජවෙන්න බෑ කියලා ඔහුට වැටහුණේ නෑ.

**දෙමළ රජෙක් පිළිබඳ අදහස යටත්විජිත ප්‍රබන්ධයක් ද?**

කලිනුත් මේ ප්‍රශ්නේ තිබුණා. එච්චර ම දරුණු විදිහට තිබුණෙ නැහැ. ඔය වගේම කීර්ති ශ්‍රී රාජසිංහ දෙමළ කියලා ඕලන්ද මිනිස්සු කිව්වා. ඕලන්දකාරයෝ අපහාස කළා. එයා දෙමළ වුණත් කිසි වැරැද්දක් නෑ. නමුත් එයා දෙමළ නොවෙයි. විශේෂයෙන් පහතරට මිනිස්සු මේ අදහස් පිළිගත්ත බව පෙනෙනවා. රජු මැරීමේ උත්සාහයකුත් තිබුණා. මරන්න හැදුවෙ වෙන කවුරුවත් නෙවෙයි සංඝරාජ හාමුදුරුවෝනේ. රජ්ජුරුවන්ට තරහකාරයෝ හිටියේ නැහැ කියලා ඉතිං අපිට පිළිගන්න පුළුවන්ද. හාමුදුරුවන්ට සංඝරාජ පදවිය පිරිනැමුවෙත් මේ රජතුමාමයි. කීර්ති ශ්‍රී ඉතාමත් හොඳ බෞද්ධ රජ කෙනෙක්. එයා උපන්නේ දකුණු ඉන්දියාවෙ. ඊට පස්සේ ලංකාවට ආවේ අවුරුදු 15-16 දී විතර. ඒත් එයා රජකළේ බෞද්ධ රජ කෙනෙක් විදියට.

**ඉදිරියේදි පළවීමට නියමිත ඔබගේ අලුත් කෘති ගැන යමක් කීවොත්?**

'ද බුද්ධ ඉන් ශ්‍රී ලංකා' කියලා කෘතියක් මුද්‍රණයේ තියෙනවා. ඊට අමතරව 1818 කැරැල්ල ගැන හා 'කිරි අම්මලා' ගැන පොත් දෙකක් ලියාගෙන යනවා. මම කොහොමත් එකවිට පර්යේෂණ කිහිපයක වැඩ කරනවා. ඒකේ වාසියකුත් තියෙනවා. එකකින් අනෙක පෝෂණය වෙනවා. අමෙරිකාවේ ඉන්න කොට මගේ පොත් කිහිපයක් ආසන්න කාලවල පළවීම ගැන ඔවුන් පුදුම වුණා. ඒ අය පුරුදුව හිටියේ එක පර්යේෂණයක් අවසන් කර තවත් එකක් කිරීමටනේ. එකවිට පොත් කිහිපයක වැඩ කිරීම ඔවුන්ට හුරු නෑ.

**චන්දන ජයවීර /දිමුතු වෙත්තසිංහ**
**සත්මඩල අතිරේකයෙනි.**